ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2023-03-28

පැමිණිලි පාර්ශවය : එස්.එස්.කේ. ගුණවර්ධන මයා,
අංක 127/2, බස්නැවතුම්පල පිටුපස,
හෙට්ටිපොල.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

02. සභාපති,
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ.2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

<u>පැමිණිලි අංකය : **HRC/1238/22**</u>

**පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති උක්ත අංක දරණ පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, තමා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වසර 07ක් පමණ සේවය කරමින් සිටියදී වැඩ තහනමකට ලක් කරන ලද බවත්, වැඩ තහනම් කරන අවස්ථාවේ කිසිදු විමර්ශනයක් හෝ නිදහසට කරුණු විමසීමක් සිදු නොකර වැඩ තහනම් කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම් කඩවූ බවත්ය. ආයතනයේ පරිපාලන හා විධායක නිලධාරීන් පිරිසක් එක්ව ගන්නා ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සම්බන්ධව ප්‍රශ්නගත ගැටළුව ඇති වී තිබෙන අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ද කරන ලද ඇගයීමකින් අනතුරුව ඉංජිනේරු කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශයේ ද එකගතාවය මත අනුමැතියකින් අනතුරුව තාක්ෂණික මෙවලම් මිලදී ගැනීමේදී ඇතිවී තිබෙන යම් යම් කරුණු මුල් කර ගනිමින් පැමිණිලිකරු පමණක් වැඩ තහනමකට ලක් කර ඇත්තේ ඉහත කමිටුව ද එක් සාමාජිකයෙකු වීම මත බව පැමිණිල්ලෙන් පෙන්වා දේ. ඒ අනුව වැඩ තහනම අත්හිටුවා නැවත සේවයේ පිහිටුවා ගැනීම පැමිණිල්ලෙන් කරන ඉල්ලීම වශයෙන් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාලව වගඋත්තර පාර්ශවය විසින් තම වාර්තාව ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම ක්‍රීඩා සංකීර්ණයේ රග්බි/පාපන්දු ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා වෙන් කර තිබූ මුදලින් වැය කර මිලදී ගත් උපකරණ/යන්ත්‍රසූත්‍ර අතරින් අත්‍යාවශ්‍ය නොවන මෙවලම් දෙකක් මිලදී ගෙන තිබීම මත විගණන වාර්තාවකින් පෙන්වා දී තිබූ කරුණු අනුව පැමිණිලිකරුගේ වැඩ තහනම් කළ බවයි. එම මෙවලම් වන්නේ තණකොළ කපන යන්ත්‍රවල තල මුවහත් කිරීමේ යන්ත්‍රයක් හා බහුකාර්ය ට්‍රැක්ටරයක් මිලදී ගැනීම සම්බන්ධ ගැටළුවක් බවද දක්වා ඇත. ඒ අනුව විගණකාධිපතිගේ වාර්තාව අනුව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8:1 පරිදි හා 8:2 පරිදි ක්‍රියා කරමින් ආයතන II කොටසේ XLVIII 31:1:8 හා 31:1:9 හා 31:1 අනුව කටයුතු කළ බවද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ වැඩ තහනම් කර මූලික පරීක්ෂණයක් කළයුතු බවට ගන්නා ලද තීරණය අනුව වැඩ තහනම් කළ බවද දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

වගඋත්තරකරුවන් සහ පැමිණිලිකරුවන් සිය කරුණු ඉදිරිපත් කිරීම ලිඛිතව සිදුකර ඇති අතර, එම කරුණු අනුව පෙනී යන්නේ තවදුරටත් වගඋත්තරකරුවන් විසින් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ 31.1.8, 31.1.9, 31.1, 31.5.2 අනුව විනය පරීක්ෂණයක් පැවැත්වීමට අදාලව ඇති ප්‍රතිපාදන යටතේ කටයුතු කරමින් සිටින බවය. ඒ අනුව විනය පරීක්ෂණයක් පැවැත්වීමට වගඋත්තරකරු හට ඇති අයිතිවාසිකම සම්බන්ධව හෝ එකී විනය පරීක්ෂණය පැවැත්වීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධව මැදිහත්වීමට හෝ මැදිහත් කරුණු දැක්වීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවශ්‍යතාවයක් නොවන බව පෙනී යයි. මන්ද යත් පැමිණිලිකරුට එම අවස්ථාවේ ඉදිරිපත්ව තමාගේ නිර්දෝෂීභාවය ඉදිරිපත් කළ හැකි වන බැවිනි. විනය පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2004(1) හා 30/2019 දරණ චක්‍රලේඛ තුළින් දක්වා ඇති කාල පරාසයන් තුළ අවසන් කළ යුතු අතර. එසේ පරීක්ෂණ අදාළ කාල පරාසය තුළ අවසන් කළ නොහැකි වන්නේ නම් එකී චක්‍රලේඛයෙහි 30/2019 හි 02 III 22:1:1 අනුව හා 06/2004(1) හි 02 II 22:1:1 අනුව කටයුතු කළ යුතු වේ.

එහෙත් ප්‍රසම්පාදන කටයුත්තක් සම්බන්ධව පැමිණිලිකරු මැදිහත්ව ඇත්තේ, එක් සාමාජිකයෙකු වශයෙන් පමණක් බව පෙනී යයි. මෙම පැමිණිලිකරු සමග එක්ව කටයුතු කළ තාක්ෂණික කමිටු සාමාජික ඉංජිනේරු අංශ නියෝජනය කළ සාමාජිකයින් හා ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් වැනි අනෙකුත් සාමාජිකයින් ඉවත් කර පැමිණිලිකරුට එරෙහිව පමණක් මූලික පරීක්ෂණ හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ප්‍රසම්පාදන කමිටුවේ පොදු එකගතාවයකට අනුව මිලදී ගන්නා ලද උපකරණ සම්බන්ධව පැමිණිලිකරු පමණක් තනිව තීරණය කළ බවක් සනාථ නොවේ. එවැනි අවස්ථාවක පැමිණිලිකරුට පමණක් නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කරමින් ඊට අදාළ අනෙකුත් කමිටු සාමාජිකයින් හට නීතිය ක්‍රියාත්මක නොකර සිටීම නීතිය ඉදිරියේ ඇති

සමානාත්මතාවයේ අයිතිවාසිකම හා නීතිය පසිඳලීම යුක්ති සහගත බව පෙනී යා යුතුය යන මූලධර්ම වගඋත්තරකරුවන් විසින් බිඳ හෙළන බව නිරීක්ෂණය වේ. ඉන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

කෙසේ වෙතත් තවදුරටත් පැමිණිලිකරුට පමණක් එරෙහිව විනය පරීක්ෂණ පවත්වාගෙන යමින් ප්‍රසම්පාදන කමිටුවේ හෝ තාක්ෂණ කමිටුවේ හෝ ඉංජිනේරු කමිටු සාමාජිකයින් විසින් අනුමත කළ භාණ්ඩ මිළදී ගැනීමෙන් පසු පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණ කටයුතු සිදු කර ඉතිරි කමිටු සාමාජිකයින් සම්බන්ධව කිසිදු පියවරක් නොගැනීමෙන් ඇතිවන වෙනස්කොට සැලකීම වෙනස් කිරීමට වඩාත් සුදුසු පියවර වන්නේ කුමන පියවර ද යන්න කොමිෂන් සභාවේ මෙම පරීක්ෂණ කටයුතු වලදී සළකා බලා ඇත. මෙහිදී වඩාත් සුදුසු පියවරක් ලෙස හඳුනා ගතහැකි වූයේ පළමු වගඋත්තරකරු විසින් සාධාරණ වූ ක්‍රියාමාර්ගයක් ඒ වන විට යෝජනා කර තිබූ බැවින් ඒ අනුව කටයුතු කිරීම බවයි. එනම්, පළවන වගඋත්තරකරු විසින් දක්වා තිබූ කාරණාවක් වූ පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමටත් ඒ අනුව ඉදිරි පරීක්ෂණ කටයුතු සිදු කිරීමටත් කරන ලද යෝජනාවයි. 2022.09.09 වන දින තම අංක MOYS/ADM/13/02/05 දරණ ලිපිය අනුව අමාත්‍යාංශයේ ලේකම්, විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා විසින් දක්වා ඇත්තේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2019 අනුව කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳ මූලික විමර්ශනයක් පැවැත්වීම මාස 02ක් ඇතුළත අවසන් කළයුතු බවත් පවත්නා නීතිරීති රෙගුලාසි වලට අනුව පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා කඩිනමින් මූලික පරීක්ෂණ සිදු කරන ලෙසත්ය.

එහෙත් වගඋත්තරකරුවන් විසින් එකී අධිකාරිය අයත් අමාත්‍යාංශය වන ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ දැන්වීමට අනුව ද කටයුතු කර නොමැත. මෙහිදී මෙම කාරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් විසින් නැවත කියා සිටියදීත්, දෙවන වගඋත්තරකරු විසින් එය ක්‍රියා කිරීම පැහැර හැර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද පළවන වගඋත්තරකරුගේ දැන්වීම ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා සිටිය ද ඒ පිළිබඳ අවධානය යොමු කරමින් දෙවන වගඋත්තරකරු පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීම සිදු නොකරන බව පැහැදිලි වේ. මෙහිදී දෙවන වගඋත්තරකරු විසින් තවදුරටත් පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණය පැවැත්වීමේ කටයුත්තේම නියැලී සිටින බව පෙනී යන අතර, ආයතන සංග්‍රහයට සමගාමීව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නැවත සේවය පිහිටුවීමට අදාළ චක්‍රලේඛීය ප්‍රතිපාදන වෙත අවධානය යොමු නොකරන බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වේ.

ඒ අනුව දෙවන වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් හා අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උල්ලංඝනය කරමින් හා පළවන වගඋත්තරකරුගේ දැනුම්දීම පරිදි පැමිණිලිකරු සම්බන්ධව කටයුතු නොකරමින් ප්‍රසම්පාදන කමිටුවේ මෙකී තීරණය ගත් අනෙකුත් සාමාජිකයින් සම්බන්ධව

කටයුතු නොකර කමිටුවේ එක් සාමාජිකයෙකු වූ පැමිණිලිකරුට එරෙහිව පමණක් කටයුතු කරමින් සිටින බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත කරුණු අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයට කටයුතු සිදු කරමින් ක්‍රියා කර ඇති බව තහවුරු වී ඇති අතර, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති සමානාත්මතාවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ කරමින් වගඋත්තරකරුවන් කටයුතු කර තිබීම මත හා තවදුරටත් මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්ත්වයක් ඇති වෙමින් පැවතීම වළක්වා ගැනීම සඳහා පහත පරිදි කටයුතු කරන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

1. පැමිණිලිකරු නියෝජනය කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික කමිටුද මෙම විෂය කාරණාවට අදාළව මුල් භාණ්ඩ මිළදී ගැනීමට සම්බන්ධ වෙනත් ආකාරයකට නියෝජනය සිදු කරන ලද නිලධාරීන් අතහැර පැමිණිලිකරු හට පමණක් චෝදනා කර මූලික පරීක්ෂණ හෝ විනය පරීක්ෂණ පැවැත්වීම, නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම හා නීතිය පසිඳලීම හා, යුක්තිය ඉටු කිරීම සාධාරණ බව පෙනී යා යුතුය යන නීතිමය මූලධර්මය බිඳ හෙළී ඇති බැවින් පැමිණිලිකරුට එරෙහිව මූලික පරීක්ෂණ හෝ විනය පරීක්ෂණ පවත්වන්නේ නම් මෙම විෂය කාරණාවට මුල් වූ භාණ්ඩ හා දේපළ මිළදී ගැනීමට අනුමත කළ වෙනත් සියළු කමිටු සාමාජිකයින් හා අදාළ නිලධාරීන්ට එරෙහිව මූලික පරීක්ෂණ හෝ විනය පරීක්ෂණ පැවැත්වීම සිදු කළයුතු අතර, එසේ සිදු නොකරන්නේ නම් පැමිණිලිකරු හට පමණක් වෙනස් ආකාරයකට සළකමින් කටයුතු නොකළ යුතු අතර, පැමිණිලිකරුද ඉන් මුදාහළ යුතුය.

2. පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා අදාළ මූලික විමර්ශන කටයුතු සිදුකළහැකි බැවින් ඒ අනුව කටයුතු කිරීමට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද දැන්වීම ප්‍රකාරව කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දන්වා තිබීම අනුව පියවර නොගැනීම සම්බන්ධව පළවන වගඋත්තරකරු විසින් දෙවන වගඋත්තරකරු සම්බන්ධව අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳ අමාත්‍යවරයා දැනුවත් කළයුතුය.

3. පළවන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා මූලික පරීක්ෂණ හෝ වෙනත් අවශ්‍ය වන ආකාරයේ පරීක්ෂණ කටයුතු සිදු කරන ලෙස දන්වා තිබුණද පළවන වගඋත්තරකාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ලිඛිතව කරන ලද එකී දැන්වීම පැහැරහැර දෙවන වගඋත්තරකරු ක්‍රියා කිරීම සම්බන්ධව පළවන වගඋත්තරකරු විසින් අමාත්‍යවරයා දැනුවත් කර සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය.

4. අංක : 06/2004(1) හා 2011.12.30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් පැමිණිලිකරු සේවයේ පිහිටුවා අදාළ මූලික පරීක්ෂණ කටයුතු හෝ වෙනත් ඊට අදාළ පියවර ගැනීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු කළයුතුය.

2023. 04 . 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත – අමාත්‍යතුමා,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

B/